සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:........................................................ විභාග අංකය:........................................................

සැලකිය යුතුයි.
- පළමු කොටසෙහි අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

01. පහත දැක්වෙන සාම්ප්‍රදායික යෙදුම් අතුරින් කතන්දරයක් ඇසුරු කරගෙන නිර්මාණය වී ඇති ප්‍රස්තාව පිරුළක් වන්නේ,
    1. පනින්න පෙර සිතා බලනු.
    2. ඉවසීමෙන් සැනසීම ලැබේ.
    3. කළුවා මාරපන් ගියා වගේ.
    4. උත්සහවන්තයා ජය ගනී.

02. ප්‍රගතිය, කීර්තිය, ප්‍රවීණ යන පදවල සමාන පද නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
    1. දියුණුව, යසස, නිපුණ
    2. දියුණුව, අයස, නවීන
    3. සුගතිය, යසස, නිපුණ
    4. විරහිත, අයස, ප්‍රාචීන

03. මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර පහකි. ඒවා නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
    1. ඤ, ජ, ඞ, ඳ, ඹ  2. ඟ, ජ, ඬ, ඳ, ඹ  3. ඟ, ඝ, ඬ, ඳ, ඹ  4. ඡ, ඟ, ඬ, ඳ, ඹ

04. පරි....මය, අත්ස....., පිළිවෙ...., පුස්....කාලය යන වචනවල හිස්තැන්වලට යෙදිය යුතු නිවැරදි අක්ෂර සහිත වරණය තෝරන්න.
    1. නා, ණ, ල, ථ  2. ණා, ණ, ළ, ත  3. නා, න, ල, ථ  4. ණා, න, ළ, ත

05. වී ගොවිතැන හා බැඳුණු බස් වහරේ දී උදේ ආහාරය, ආහාර අනුභව කිරීම, කළය, සුදු රෙද්ද යන ඒවා හඳුන්වන ආකාරය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
    1. හීල් අඩුක්කුව, සප්පායම, කුඹල් ගෙඩිය, පිරුවටය
    2. සප්පායම, හීල් අඩුක්කුව, කුඹල් ගෙඩිය, පිරුවටය
    3. කුඹල් ගෙඩිය, සප්පායම, හීල් අඩුක්කුව, පිරුවටය
    4. හීල් අඩුක්කුව, කුඹල් ගෙය, සප්පායම, පිරුවටය

06. සිංහල භාෂාවේ උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ බහු වචන නාම පද නිවැරදි පිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
    1. මම, නුඹ, ඔහු  2. මම, නුඹලා, ඔවුහු  3. අපි, නුඹලා, ඔවුහු  4. අපි, නුඹලා, ළමයා

07. පහත වාක්‍යයේ ඉරි ඇඳි ස්ත්‍රී ලිංග පදවලට ගැළපෙන පුරුෂ ලිංග පද නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

    <u>වෙළඹ</u> එනු දුටු <u>සෙබඩ</u> වේගයෙන් <u>බිසව</u> ළඟට දිව ගියා ය.
    1. මයිනා, නරියා, රජ
    2. අශ්වයා, මොනරා, රජ
    3. හරකා, ගිරවා, රජ
    4. අශ්වයා, කුරුල්ලා, රජ

08. මෙහි දැක්වෙන ළමයෙක්, මනාලියක්, කුරුල්ලා යන උක්ත පදවල අනුක්ත රූපය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
    1. ළමයින්, මනාලියක, කුරුල්ලා
    2. ළමයෙකු, මනාලියෙකු, කුරුල්ලා
    3. ළමයෙකු, මනාලියක, කුරුල්ලා
    4. ළමයින්, මනාලියෙකු, කුරුල්ලා

09. පහත දැක්වෙන වාක්‍යයේ ඉරි ඇඳි පදවලට ගැළපෙන විරුද්ධාර්ථ පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

ඔහුගේ උත්තම ගුණ දැක අවමාන කළ පිරිසට ඔහු මෛත්‍රී කළේ ය.

1. උසස්, අසමාන, කරුණා
2. අධම, සම්මාන, ක්‍රෝධ
3. අධම, විමාන, කරුණා
4. උසස්, සම්මාන, ක්‍රෝධ

10. පහත වාක්‍යයේ ඉරි ඇඳි පදවලට ගැළපෙන ක්‍රියා වර්ගය නිවැරදිව දැක්වෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

අක්කා මල් නෙළා වට්ටියට එකතු කරමින් සතුටින් සිනාසුණා ය.

1. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
2. පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
3. අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
4. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

11. පහත දැක්වෙන වාක්‍යයේ යටින් ඉරි ඇඳි පදවල නිවැරදි අර්ථ අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.

''රජ්ජුරුවෝත් තමන්ගේ පුතණුවන්ට මස්සෙන් දහසක්, පිළිසඟලක් හා වහන් සඟලක් ආදි වූ දෙය දී ආචාරීන් වෙත යැවූ හ''.

1. රන් කාසි දහසක්, රෙදි යුගලක්, පාවහන් යුගලක්
2. රන් කාසි දහසක්, පාවහන් යුගලක්, රෙදි යුගලක්
3. රෙදි යුගලක්, රන් කාසි දහසක්, පාවහන් යුගලක්
4. පාවහන් යුගලක්, රෙදි යුගලක්, රන් කාසි දහසක්

12. රාජකාරී ලිපියක මූලිකාංග නිවැරදි ව අනුපිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. දිනය, යවන්නාගේ ලිපිනය, ලබන්නාගේ ලිපිනය
2. යවන්නාගේ ලිපිනය, දිනය, ලබන්නාගේ ලිපිනය
3. ලබන්නාගේ ලිපිනය, දිනය, යවන්නාගේ ලිපිනය
4. දිනය, ලබන්නාගේ ලිපිනය, යවන්නාගේ ලිපිනය

13. පහත දැක්වෙන කවි පදවල ඉරි ඇඳි කොටස්හි අර්ථ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

සිලිලාරෙක හෙල්මැලි
දම් පාටින් ඔප දමා
සිනිඳු කොපුව ඇඳ හෙළා

1. ජල තලාව, දිස්නය, වැස්ම
2. ජල තලාව, වැස්ම, දිස්නය
3. වැස්ම, දිස්නය, ජල තලාව
4. දිස්නය, වැස්ම, ජල තලාව

14. වත සුපිපි කුසුමෙකි - නෙත සුනිල් මිණි යුවළෙකි -
ගත ගන රන් රුවෙකි - වනත නත මුත් කවුරු වෙති හැකි

මෙම කවියේ අක්ෂර යොදා ඇත්තේ කිසියම් ශබ්ද රටාවකට ය. එම ශබ්ද රටාව හඳුන්වන්නේ:

1. විරිත යනුවෙනි.
2. රූපක යනුවෙනි
3. අනුප්‍රාසය යනුවෙනි
4. එළිසමය යනුවෙනි

15. පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පද සඳහා යෙදිය හැකි තනි පද නිවැරදි ව අනුපිළිවෙළට යෙදී ඇති පිළිතුර තෝරන්න.

ගලෙහි කෙටූ ලියවිල්ලේ විහාර සඳහා පූජා කරන ලද ඉඩම් පිළිබඳ ව සඳහන් වන අතර එය නැවත සකස් කිරීමට කාලය උදා වී ඇත.

1. සෙල්ලිපි, ප්‍රතිසංස්කරණය, ගම්වර
2. ගම්වර, සෙල්ලිපි, ප්‍රතිසංස්කරණ
3. ප්‍රතිසංස්කරණය, සෙල්ලිපි, ගම්වර
4. සෙල්ලිපි, ගම්වර, ප්‍රතිසංස්කරණය

16. පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් වන ව්‍යාකරණ වර්ගය පිළිවෙළින් තෝරන්න.

ලොකු අම්මා රසවත් ආහාරයක් පිළියෙළ කරද්දී මම සතුටින් සිනාසුනෙමි.

1. ක්‍රියා විශේෂණ, නාම විශේෂණ, නාම විශේෂණ
2. නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, නාම විශේෂණ
3. නාම විශේෂණ, නාම විශේෂණ, ක්‍රියා විශේෂණ
4. ක්‍රියා විශේෂණ, නාම විශේෂණ, ක්‍රියා විශේෂණ

17. පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පදවල අර්ථය වැරදි ය. අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

ලෝකෝපකාරය <u>අනුරාධපුර</u> යුගයේ දී <u>රාහුල</u> හිමියන් විසින් රචනා කරන ලද <u>සන්දේශ</u> කාව්‍යයකි.

1. කෝට්ටේ, රණස්ගල්ලේ, උපදේශ
2. මහනුවර, වැත්තෑවේ, උපදේශ
3. කෝට්ටේ, වැත්තෑවේ, උපදේශ
4. කෝට්ටේ, එස්. මහින්ද, උපදේශ

18. පහත දැක්වෙන වාක්‍යයේ හිස්තැන්වලට සුදුසු විරාම ලකුණු ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

ඒ බමුණා වහ ..... වහා ම දිවගෙන ගොස් සේනාව මැදට පැන මෙසේ කියාලී ය..... "ඇයි .... කුමක් කියමු ද? මම ගොවියා පුතු නොවැන්දෙමි".

1. දෙතිත, කෙටි ඉර, ප්‍රශ්නාර්ථ ලකුණ
2. කෙටි ඉර, දෙතිත, ප්‍රශ්නාර්ථ ලකුණ
3. ප්‍රශ්නාර්ථ ලකුණ, දෙතිත, කෙටි ඉර
4. කෙටි ඉර, ප්‍රශ්නාර්ථ ලකුණ, දෙතිත

19. නිවැරදි ලෙස පද බෙදා, ලියා ඇති පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

1. "මව් බිමේ උපන් මාගේ දරුවනි! පර සිරිතට ගැති නොව ව්"
2. "කටු පඳුරුවලින් ගහන වූ වනයෙහි ඇවිදීම අපහසු ය".
3. මේවා අනෙකුත් අප ද්‍රව්‍යවලට වඩා බෙහෙවින් අහිතකරය.
4. "මාගේ දරුවනි! දියුණුවේ මග අනු ගමනය කරව්"

20. සමන් පිච්ච මල් ඉහුරුණු
නිල් තණ කොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද ඊට

මෙම කාව්‍යයෙහි දක්වෙන කාව්‍යෝක්තිය වන්නේ,

1. විරිතයි
2. අනුප්‍රාසයයි
3. එළි සමයයි
4. උපමාවයි

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- 01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තවත් <u>ප්‍රශ්න තුනක්</u> තෝරා ගෙන <u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු ලියන්න.

01. පන්ති කාමර කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) බිත්ති පුවත්පතට යෙදූ නම කුමක් ද? (ල. 01)

(ii) බිත්ති පුවත්පතට ඇතුළත් කළ නිර්මාණ දෙකක නම් ලියන්න. (ල. 04)

(iii) බිත්ති පුවත්පත නිර්මාණයේ දී ඔබ තොරතුරු ලබා ගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 04)

(iv) බිත්ති පුවත්පත නිර්මාණයේදී ගුරුතුමාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ල. 04)

(v) මෙම ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(i) පියකරු උදෑසනක්.

(ii) පුස්තකාලයෙන් නිසි ප්‍රයෝජන ගනිමු.

(iii) ගැමි දිවියේ මිහිර.

(iv) උදාරයි මගේ මව්බිම.

(v) සුන්දර පරිසරයක් ගොඩනගමු.

(ලකුණු 14)

03. ඔබ පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගමන් අපහසුතා දක්වා පාසලට පැමිණීමට හා පිට වී යාමට බස් රථයක් ඉල්ලා ප්‍රදේශයේ ලං.ග.ම ඩිපෝවේ ඩිපෝ අධිකාරීතුමාට රාජකාරී ලිපියක් ලියන්න. ඔබ, පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා යැයි සිතන්න. (ලකුණු 10)

04. පහත සඳහන් පද්‍යවල ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(i) සිලිලාරෙක හෙල් මැලී
පෙති අතරින් සැලි සැලී
.......................................................
.......................................................

(ii) .......................................................
.......................................................
මා ගත් මුල් සුසුමත් දුන් ලංකා
මා පණ මෙන් ඔබ රක්නෙමි ලංකා

(ලකුණු 02 × 05 = 10)

05. පහත වගුවේ දක්වා ඇති කොටස්වල අවස්ථා සම්බන්ධය ලියන්න.

| ප්‍රකාශය | ප්‍රකාශ කළේ කවුරුන් ද? | කාට ද? |
|---|---|---|
| (i) "කිරි ලැබෙන්නේ කොහෙන් ද? වෙඬරු නැතිව උයන්නේ කොහොම ද?" | | |
| (ii) "යතුර බිස්ස ළඟ එල්ලලා ඇති" | | |
| (iii) "දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගෙන එව" | | |
| (iv) "කීය ද මේ තොප්පි? ගණන් ද මේ තොප්පි?" | | |
| (v) "අපි විවේකය ප්‍රයෝජනවත්ව ගත කිරීමට පුරුදු වුණා" | | |

(ලකුණු 02 × 05 = 10)

06. පහත දී ඇති වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කොට ලියන්න.

(i) ගුරුවරුන් ළමයි යහමග යවති.
(ii) ළමයි බස් නැවතුම් පොළට ගියා ය.
(iii) කාන්තාවක තල වේලමින් සිටියා ය.
(iv) රාජ කුමාරයන් නාන්නට වැවට ගියේ ය.
(v) දිසාපාමොක් ආචාරීන් කුමරුට ශිල්ප ඉගැන්වූහ. (ලකුණු 02 × 05 = 10)

07. පහත සඳහන් ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

දවල් කාලයේ ඇති මල් විවිධාකාරයේ සහ විවිධ වර්ණයන්ගෙන් යුක්ත වේ. මෙම මල් වර්ග ඉතා අලංකාරවත් ලෙස සහ වර්ණවත් ලෙස පිපීමට හේතුව වන්නේ මලක් කරා කෘමි සතුන් ඇද ගැනීමේ උපාය මාර්ගයක් ලෙසයි. මෙසේ පැමිණෙන කෘමි සතුන්ගෙන් පරාගනය සිදුවීම එහි අපේක්ෂාවයි. ආලෝකය ඇති දිවා කාලයට මෙසේ විවිධ හැඩයන් හා වර්ණයන් වැදගත් වුව ද රාත්‍රී කාලයට මේ වර්ණයන් වැදගත් කමක් දක්නට නොලැබේ. රාත්‍රියට පිපෙන මල් සුදු පැහැයෙන් යුක්ත වීම නිසා මල් කරා ඇදෙන කෘමි සතුන්ට පහසුවෙන් එය සොයා ගැනීමට හැකියාව ඇත. එනිසා රාත්‍රියට පිපෙන මල් සුදු පැහැයෙන් යුක්ත ය. දිවා කාලයේ මල්වල සුගන්ධයට වඩා රාත්‍රී කාලයට පිපෙන මල්වල සුවඳ වැඩි ය. එයට හේතුව කෘමීන් ඇද ගැනීමයි. මෙ මගින් පරාගනය සිදු වීම ප්‍රධාන වාසියක් ලෙස හැඳින්විය හැකි ය.

(i) රාත්‍රියට පිපෙන මල්වල විශේෂ ගුණාංග දෙකක් ලියන්න.
(ii) ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?
(iii) මල්වල පරාගනය සිදු වන්නේ කෙසේ ද?
(iv) දිවා කාලයේ පිපෙන මල්වල ගුණාංග දෙකක් ලියන්න.
(v) පහත සඳහන් වචනවල තේරුම ලියන්න.
(අ) වර්ණ ........................ (ආ) අපේක්ෂාව ........................

(ලකුණු 02 × 05 = 10)